---

මහව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 17 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මහව ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට මහව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ). ශේෂ පත්‍රය අනුව අතැති තොග ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට රු.541,322 ක ශේෂයක් පැවතියද ඊට අදාල තොග පොත් අනුව භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ එවැනි තොග ශේෂයක් දක්වා නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය අවසානයේ සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අස්ථානගතව හා ඉවත් කිරීමට යෝජිතව පැවති වටිනාකම රු.28,064 ක් වූ පොත් තොගයක් ගිණුම් වලින් අනාවරණය කර නොතිබූ අතර, ලෙජරයේ පුස්තකාල පොත් ගිණුමේ සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති ශේෂය භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අනාවරණය වූ ශේෂයට සමාන කිරීම සඳහා ජනල් සටහන් අංක 91 මගින් රු.333,353 ක මුදලක් පුස්තකාල පොත් ගිණුමට හරකර අදාල වැය ශීර්ෂයට (609) බැර කිරීම පමණක් සිදුකර තිබුණි.

(ඇ). 2009 වර්ෂයේ සිට පැවති රු.57,498 ක් වූ නොගෙවූ වැටුප් හා වේතන සහ පළාත් පාලන වෘත්තීය ණය වශයෙන් පැවති රු.2,075 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 11 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.40,898,859 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.39,128,047 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,787,444 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,919,740 ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.7,958,594 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.963,209 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු. 000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 2,027 | 1,931 | 1,871 | 2,217 | 2,089 | 1,813 |
| (ii) | බදුකුලී | 5,300 | 5,337 | 334 | 4,500 | 4,868 | 373 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 325 | 174 | 10 | 800 | 819 | 20 |
| (iv) | වෙනත් ආදායම් | 40,402 | 21,883 | 9,740 | 35,873 | 19,445 | 6,061 |
| | එකතුව | 48,054 | 29,325 | 11,955 | 43,390 | 27,221 | 8,267 |

2.2.3 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකල රු.3,791,075 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.4 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.1,497,355 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.5 වාර්ෂික මත බදු හා දීර්ඝකාලීන බදු

වාර්ෂික ටෙන්ඩර් කිරීම් මත අවස්ථා 13 ක් යටතේ 1980 සිට 2005 කාලයට අදාලව රු.284,798 ක හිඟ ශේෂයක් හා දීර්ඝ කාලීන බදුදීම් යටතේ අවස්ථා 03 කට අදාලව 2002 වර්ෂයේ සිට පැවත එන රු.32,432 ක හිඟ ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැවතුනි.

2.2.6 කඩ කාමර බදු

සභාව සතු පොදු වෙළඳපල අංක 06 කඩ කාමරයට අදාලව 2004 වර්ෂයේ සිට පැවති රු.30,099 ක හිඟ මුදල ඊට වගකිව යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකර ගත යුතු බවට 2006 සැප්තැම්බර් 20 දිනැති ලිපියෙන් පළාත් පාලන කොමසාරිස් දනවා තිබුණි. අදාල නිලධාරීන් විසින් ඒ සඳහා විධිමත් පරීක්ෂණයක් ඉල්ලා තිබූ අතර, පළාත් පාලන කොමසාරිස් ගේ 2010 ජනවාරි 17 දිනැති ලිපියෙන් විධිමත් පරීක්ෂණයක් සිදුකරන ලෙස දන්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම එවැන්නක් සිදුව නොතිබුණි.

2.2.7 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට අදාල ලේඛන අනුව වරිපනම් බදු හිඟය රු.1,123,361 ක් වූ අතර 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ 33 සිට 41 රීති ප්‍රකාරව මෙම හිඟයන් අයකර ගැනීම සඳහා කාර්තු වශයෙන් හිඟ ලැයිස්තු පිළියෙල කර වරෙන්තු නිකුත් කිරීමක් සිදුකල යුතු වුවද, එලෙස කාර්තු වශයෙන් වරෙන්තු නිකුත් කර හිඟ අයකිරීමක් සිදුකර නොතිබූ අතර වර්ෂ අවසානයට පමණක් හිඟ ලැයිස්තුවක් පිළියෙල කර තිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 27,533 | 22,015 | 5,518 | 22,402 | 21,965 | 437 |
| අනෙකුත් | 16,171 | 29,078 | (12,907) | 14,465 | 35,348 | (20,883) |
| උප එකතුව | 43,704 | 51,093 | (7,389) | 36,867 | 57,313 | (20,446) |
| ප්‍රාග්ධන වියදම | 45,045 | 74,785 | (29,740) | 6,520 | 41,481 | (34,961) |
| මුළු එකතුව | 88,749 | 125,878 | (37,129) | 43,387 | 98,794 | (55,407) |

2.4 අධිභාර

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ172 ((3) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණ අධිභාර අගය රු.5,384 ක් විය.

2.5 මානව සම්පත් කළමණාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතියික | 30 | 24 |
| ප්‍රාථමික | 56 | 52 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 35 |

2.6 වත්කම් කළමණාකරණය

2.6.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.55,805,842 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.4,410,630 ක් විය.

2.6.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවීම හිඟහිට තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.173,842 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව ද රු173,842 ක් විය.

2.6.3 සමීක්ෂණය නොකළ වත්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට රු.30,578,639 ක් වටිනාකම් ඇති ඉඩම් හා ගොඩනැගිලි පැවතියද ඒ සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා රීති මාලාවේ රීති 218 හි දක්වා ඇති පරිදි වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

2.7 අවිධිමත් ගනුදෙනු

පොදු වෙළඳපල කඩ කාමර බදු ගිවිසුම් අනුව එකී කඩ කාමරවල විදුලි බිල් නිරවුල් කිරීම කුමන පාර්ශවයන් විසින් සිදුකල යුතුද යන්න පැහැදිලි නොවුනි. ඒ හේතුවෙන් පොදු වෙළඳපල අංක 22 කඩ කාමරය බදුගෙන තිබූ බදුකරු විසින් විදුලි බිල්පත් නොගෙවීම මත 2008 වර්ෂය අවසන් වන විට විදුලිය විසන්ධි කර පැවති අතර නැවත විදුලිය ලබා ගැනීම සඳහා රු.10,474 ක් ද නැවත 2009 දෙසැම්බර් 31 දින විදුලිය විසන්ධි කර පැවති අතර විදුලිය ලබාගැනීම සඳහා රු.1,456 ක් ද ලංකා විදුලිබල මණ්ඩලයට සභා අරමුදලින් ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම නව වෙළඳ සංකීර්ණයේ අංක 02 කඩ කාමරය සඳහා අදාල බදුකරු විසින් විදුලිබිල් නොගෙවීම මත 2007 වර්ෂය වන විට විදුලිය විසන්ධි කර තිබූ අතර නැවත විදුලිය ලබාගැනීම සඳහා රු.12,235 ක් ද ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවීමට සභාවට සිදුව තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයින්ට අදාලව සභාව විසින් එකී අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු. 3,399,496 ක් ව තිබුණි.

2.9 කාර්ය සාධනය

(අ). සමාලෝචිත වර්ෂය තුල අයවැය ලේඛනය මගින් සෞඛ්‍ය හා සුභ සාධන සේවා යටතේ රු.1,050,000 ක ඇස්තමේන්තු ගත පිරිවැයක් යටතේ ඉටුකිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති 08 ක් අවශ්‍ය අරමුදල් නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුල ජාතික සවිය, ගම නැගුම අදියර II හා සභා අරමුදල් යටතේ ඉටුකිරීමට ඇස්තමේන්තු කර තිබූ පිරිවැය රු.5,459,433 ක් වූ ව්‍යාපෘති 10 ක් කාලය හා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

2.10 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

03. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පාලනය
(ඈ) වත්කම් කළමනාකරණය